**20.** **ශීර්ෂය 20 - මැතිවරණ දෙපාර්තමේන්තුව**

---

**20.1** **විගණන විෂය පථය**

---

මැතිවරණ දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 28 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**20.2** **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**20.3** **විගණන නිරීක්ෂණය**

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මැතිවරණ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) හී දක්වා ඇති පොදු නිරීක්ෂණය සහ පහත 20.4 සිට 20.5 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ)** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

---

විෂය අංක 02001 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.972,966 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත් වී තිබුණි.

**20.4 අවිධිමත් ගනුදෙනු**

---------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) මැතිවරණ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලට එකතු කිරීම්, වැඩිදියුණු කිරීම්, මැතිවරණ කොමසාරිස්වරයාගේ නිල කාමරය හා සම්බන්ධ වැසිකිළිය, නාන කාමරය අලුත්වැඩියා කිරීමේ කටයුතු වෙනුවෙන් රු.43,806,496 ක ඇස්තමේන්තුවක් මත ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව රු.250,000 ක් ඉක්මවන වැඩ සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹිය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමග විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ii) කොන්ත්‍රාත්කරු වෙත 2013 මාර්තු 08 දින හා 2013 ජූලි 08 දින පිළිවෙලින් රු.මිලියන 10 ක් හා රු.මිලියන 12 ක් ගෙවා තිබුණත්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 මාර්ගෝපදේශය ප්‍රකාරව (Retention Money) මුදලක් රඳවා ගෙන නොතිබුණි.

(ආ) 2012 අගෝස්තු 25 දිනැති අංක PCE/24/2012 දරන මැතිවරණ කොමසාරිස්වරයාගේ චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව විශාල අලුත්වැඩියාවන් සඳහා වියදම් දැරීමට සිදුවන වාහන ඡන්ද විමසීමේ කටයුතු සඳහා යොදා නොගත යුතු වුවද, අළුත්වැඩියා තත්ත්වයේ පැවැති රජයේ දෙපාර්තමේන්තුවක් සතු වාහනයක් 2012 සැප්තැම්බර් 08 දින පැවති පළාත් සභා ඡන්ද විමසීම් කටයුතු සඳහා යෙදාගෙන තිබුණු අතර එහි අළුත්වැඩියාවන් වෙනුවෙන් රු.883,921 ක් මැතිවරණ දෙපාර්තමේන්තුව වැය කර තිබුණි.

**20.5 මානව සම්පත් කළමනාකරණය.**

--------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

------------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 41 | 32 | 09 |
| (ii) | තෘතීයික මට්ටම | 13 | 06 | 07 |
| (iii) | ද්විතීයික මට්ටම | 481 | 338 | 143 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 158 | 143 | 15 |
| | **එකතුව** | **693** | **519** | **174** |

2013 දෙසැම්බර් 31 දින වන විට පුරප්පාඩු 174 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.